**පොලිස් මූලස්ථානය, කොළඹ, ශ්‍රී ලංකාව**
**பொலிஸ் தலைமையகம், கொழும்பு, இலங்கை**
**POLICE HEADQUARTERS, COLOMBO, SRI LANKA**

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. : 517
දුරකථනය / தொலைபேசி / Telephone : +94 (0) 11 24 21 750, +94 (0) 11 24 21 111 - 9
ෆැක්ස් / தொலைநகல் / Fax : +94(0) 11 24 46 174, +94(0) 11 24 40 440
ඊ-මේල් / மின் அஞ்சல் / E-mail : igp@police.lk, telligp@police.lk
website: www.police.lk

මගේ අංකය / எனது இல. / My No. : Staff DIG/IG/OUT/05/2682/2020
ඔබේ අංකය / உமது இல. / Your No :
දිනය / திகதி / Date : 2020.04.07

## ඇඳිරි නීති බලපත්‍ර නිකුත් කිරීම විධිමත් කිරීම

කොරෝනා වෛරස් රෝගය (කොවිඩ් - 19) ව්‍යාප්තිය වැලැක්වීම සඳහා, නිරෝධායන හා රෝග වැලැක්වීමේ ආඥා පනතේ විධිවිධාන සහ රෙගුලාසි උල්ලංඝණය කරමින් කටයුතු කිරීම වැලැක්වීමට ඇඳිරි නීතිය වරින් වර පැනවීමට කටයුතු කරනු ලැබේ.

එවැනි අවස්ථාවල දී ඇඳිරි නීති බලපත්‍ර ලබාගැනීම සඳහා පුද්ගලයින් විශාල වශයෙන් පොලිස් ස්ථානයන්හි එක්රැස් වන බව නිරීක්ෂණයට ලක්වී ඇත. එබැවින් ඇඳිරි නීති බලපත්‍ර නිකුත් කිරීම විධිමත්ව සිදු කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කර ඇත.

**1. පොලිස් මූලස්ථානය මගින් නිකුත් කිරීම**

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති සේවකයින් 50 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවය කරන කර්මාන්ත / ආයතන / සමාගම් සඳහා ඇඳිරි නීති බලපත්‍ර නිකුත් කිරීම පොලිස් මූලස්ථානය මගින් සිදු කරනු ලැබේ.

**2. පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය මගින් නිකුත් කිරීම**

බස්නාහිර පළාතේ ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්ක තුළ පිහිටා ඇති සේවකයින් 50 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවය කරන කර්මාන්ත / ආයතන / සමාගම් සඳහා ඇඳිරි නීති බලපත්‍ර නිකුත් කිරීම බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය මගින් සිදු කරනු ලැබේ.

බස්නාහිර පළාත හැර අනෙකුත් පළාත් තුළ පිහිටා ඇති සේවකයින් 50 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවය කරන කර්මාන්ත / ආයතන / සමාගම් සඳහා ඇඳිරි නීති බලපත්‍ර නිකුත් කිරීම, එම එක් එක් පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය මගින් සිදු කරනු ලැබේ.

3. කොට්ඨාස භාර පොලිස් අධිකාරී කාර්යාලය මගින් නිකුත් කිරීම

එක් එක් පොලිස් කොට්ඨාස බලප්‍රදේශය තුළ පිහිටා ඇති සේවකයින් 10 ක් හෝ ඊට වැඩි සහ 50 ට අඩු සේවක සංඛ්‍යාවක් සේවය කරන කර්මාන්ත / ආයතන / සමාගම් සඳහා ඇඳිරි නීති බලපත්‍ර නිකුත් කිරීම එක් එක් කොට්ඨාස භාර පොලිස් අධිකාරී කාර්යාලය මගින් සිදු කරනු ලැබේ.

4. පොලිස් ස්ථාන මගින් නිකුත් කිරීම

පොලිස් ස්ථාන මට්ටමින්,

i). පොලිස් බලප්‍රදේශය තුළ පිහිටා ඇති සේවකයින් 10 කට අඩු සේවක සංඛ්‍යාවක් සේවය කරන කර්මාන්ත / ආයතන / සමාගම් සඳහා ඇඳිරි නීති බලපත්‍ර නිකුත් කිරීම
ii). අතිශය මානුෂීය හේතූන් මත පෞද්ගලික තැනැත්තන්ට නිකුත් කිරීම

සිදු කරනු ලැබේ.

## බලපත්‍ර ඉල්ලුම් කිරීම සඳහා උපදෙස්

ඉහත පරිදි තම කර්මාන්ත ශාලාව, ආයතනය හෝ සමාගම සඳහා ඇඳිරි නීති බලපත්‍ර ඉල්ලුම් කළ යුත්තේ කුමන කාර්යාලය වෙත ද යන්න අවබෝධ කර ගැනීමෙන් පසු එම කාර්යාලය වෙත සෘජුව ම ඇඳිරි නීති බලපත්‍ර ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත් යොමු කළ යුතු බව දන්වා සිටිනු ලැබේ.

1. ඇඳිරි නීති බලපත්‍ර නිකුත් කිරීම සඳහා ඉල්ලුම් කරන සෑම තැනැත්තකුම / කර්මාන්ත ශාලා / ආයතන / සමාගම් ප්‍රධානියකුගෙන් ම පහත සඳහන් කරුණු ඇතුළත් අයදුම්පතක් ආවරණ ලිපියක් ද සහිතව ඉහත දක්වා ඇති පරිදි අදාළ කාර්යාලය වෙත යොමු කළ යුතු ය.

❖ වාහන සඳහා ඇඳිරි නීති බලපත්‍ර ඉල්ලුම් කිරීම පහත ආකෘතිය අනුව සිදුකළ යුතු ය.

| අනු අංකය | නම | වාහන අංකය | මාර්ගය | | කාලය | |
|---|---|---|---|---|---|---|
| | | | ආරම්භය | ගමනාන්තය | සිට | දක්වා |
| | | | | | | |

❖ පුද්ගලයින් සඳහා ඇඳිරි බලපත්‍ර ඉල්ලුම් කිරීම පහත ආකෘතිය අනුව සිදුකළ යුතු ය.

| අනු අංකය | නම | හැඳුනුම්පත් අංකය | මාර්ගය | | කාලය | |
|---|---|---|---|---|---|---|
| | | | ආරම්භය | ගමනාන්තය | සිට | දක්වා |
| | | | | | | |

2. සෑම අයදුම්පතක ම ඇඳිරි නීති බලපත්‍ර ඉල්ලා සිටින හේතුව සහ අයදුම්කර ඇති වාහන, තැනැත්තන් එම ආයතනයේ කර්තව්‍යයන් පවත්වාගෙන යාම සඳහා අත්‍යවශ්‍ය ම බව සහ ගමන් කරන ප්‍රදේශ සඳහා එම තැනැත්තන් හා වාහන යැවීම අත්‍යවශ්‍ය ම හේතුවක් මත සිදුකරන බව අයදුම්කරන අවස්ථාවේ දී තහවුරු කළ යුතු වේ.

3. වාහන ගමන් කරන මාර්ගය නිශ්චිත ව සඳහන් කළ යුතු අතර, කිසිදු වාහනයක් හෝ තැනැත්තකු සඳහා ශ්‍රී ලංකාව පුරාම ගමන් කළ හැකි වන පරිදි ඇඳිරි නීති බලපත්‍ර නිකුත් කරනු නොලැබේ. එසේ වුව ද අවශ්‍යතාවය අනුව දිස්ත්‍රික් මායිම් හරහා ගමන් කිරීමට ඇඳිරි නීති බලපත්‍ර ලබා ගත හැකි ය.

4. ඇඳිරි නීති බලපත්‍ර ඉල්ලා සිටින සෑම තැනැත්තකුම / කර්මාන්ත ශාලාවක / ආයතනයක / සමාගමක ප්‍රධානියකුම ඇඳිරි නීති බලපත්‍ර තමා / තම සේවකයින් වෙත ලබා ගැනීම හේතුවෙන් එම ආයතනයේ සේවකයින්ට කොරෝනා වෛරස් රෝගය (කොවිඩ් 19) ආසාදනය වීමට ඇති අවදානම පිළිබඳ අවබෝධ කර ගැනීමෙන් පසු එසේ ඉල්ලුම් කරන බව සලකනු ලැබේ.

5. කොරෝනා වෛරස් රෝගය (කොවිඩ් 19) ශ්‍රී ලංකාව තුළ පැතිරීම වැලැක්වීම පිණිස නිරෝධායන රෙගුලාසි උල්ලංඝණය කිරීම වැලැක්වීම සඳහා ඇඳිරි නීතිය පැනවීමට ක්‍රියාකර ඇති බැවින් සෑම ඇඳිරි නීති බලපත්‍ර අයදුම්කරුවකු විසින් ම සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කර ඇති පරිදි සෞඛ්‍ය ආරක්ෂණ විධි ඇඳිරි නීති බලපත්‍රකරු විසින් අනුගමනය කරන බවට සහතික විය යුතු ය.

පහත සඳහන් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල, අධිකාරි සහ ආයතන වල සේවකයන් සඳහා තම රාජකාරී / සේවා හැඳුනුම්පත ඇඳිරි නීති බලපත්‍රයක් වශයෙන් භාවිත කිරීම සඳහා අවසර දෙනු ලැබේ.

1. ජනාධිපති කාර්යාලය
2. අග්‍රාමාත්‍ය කාර්යාලය
3. සියලු ම විදේශ තානාපති කාර්යාල
4. විදේශ කටයුතු අමාත්‍යාංශය
5. මුදල් අමාත්‍යාංශය
6. සෞඛ්‍ය අමාත්‍යාංශය
7. ආරක්ෂක අමාත්‍යාංශය
8. කෘෂිකර්ම අමාත්‍යාංශය
9. ශ්‍රී ලංකා මහබැංකුව
10. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
11. සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
12. සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව
13. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
14. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
15. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
16. ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුව
17. ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව
18. ගොවිජන සේවා දෙපාර්තමේන්තුව
19. ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුව
20. සුරාබදු දෙපාර්තමේන්තුව
21. දිස්ත්‍රික් ලේකම් කාර්යාල
22. ප්‍රාදේශීය ලේකම් කාර්යාල
23. ශ්‍රී ලංකා රේගුව
24. ශ්‍රී ලංකන් ගුවන් සමාගම
25. ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගම
26. ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම
27. රජයේ මුද්‍රණාලය
28. ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
29. සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව
30. සීමාසහිත ඛනිජ තෙල් ගබඩා පර්යන්තය
31. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
32. ලංකා ආයෝජන මණ්ඩලය
33. ලංකා විදුලිබල මණ්ඩලය
34. ලංකා විදුලි පෞද්ගලික සමාගම
35. ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය
36. ශ්‍රී ලංකා වරාය අධිකාරිය
37. ලංකා නැව් සමාගම
38. පාරිභෝගික සේවා අධිකාරිය
39. සියලු ම රාජ්‍ය හා පෞද්ගලික බැංකු
40. සියලු ම පෞද්ගලික රෝහල්
41. සියලු ම රක්ෂණ සමාගම්
42. සියලු ම මාධ්‍ය සේවා ආයතන
43. සියලු ම පළාත් පාලන ආයතන

එසේ වුව ද සේවා අවශ්‍යතාවයක් නොමැති ව ඇඳිරි නීති කාලය තුළ තම සේවා හැඳුනුම්පත අවභාවිත කරමින් කටයුතු කිරීම ආයතනික විධිවිධාන යටතේ විනයානුකූලව කටයුතු කිරීමට මෙන් ම අපරාධ නීතිය යටතේ කටයුතු කිරීමට හේතු විය හැකි බව සැලකිල්ලට යොමු කරවමි.

තව ද ඉහත සඳහන් ආයතනවල අවම සේවකයන් සංඛ්‍යාවක් සේවය සඳහා යෙදවීමටත්, එම සේවකයන් අත්‍යවශ්‍ය සේවා සඳහා ගමන් කරන දිනය, වේලාව, ස්ථානය හෝ ප්‍රදේශ සහ වාහන අංකය පිළිබඳව වාර්තා අදාළ සේවා ස්ථානවල තබා ගැනීම සඳහා කටයුතු කළ යුතු බවට අවධාරණය කරනු ලැබේ.

පොලිස්පති
ශ්‍රී ලංකා පොලීසිය

මං/-